**ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාව**

**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මතය

------

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පින්ඩන වාර්තාව 2022 මැයි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 14 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සියයට 13 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | 2020 ඔක්තෝබර් මස සම්මත වූ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා බලතල අඩුවීම මත කාර්යමන්ඩලය අඩුවීම ඇස්තමේන්තු සකස් කිරීමේදී සැලකිල්ලට ගැනීමේ හැකියාව නොතිබුණි. | ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනයට අනුව 47 ව්‍යවස්ථාවේ 155 ඊ යටතේ කොමිෂන් සභාව විසින්, ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තෙකුගෙන් ලැබෙන | ජාතික පොලිස් කොමිෂන් සභා පනත සකස්කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටින අතර, පනත සම්මත කරගැනීමෙන් පසු මහජන පැමිණිලි විමර්ශනය සඳහා කාර්ය | අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරුනු බලතල ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| පැමිණිලි භාර ගැනීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා කාර්ය පටිපාටි ස්ථාපිත කිරිමට රීති සාදනු ලැබිය යුතුය. ජාතික පොලිස් කොමිෂන් සභා පනත සකස් කර ගැනීමෙන් පසු රීති සකස් කර ගැනීමට තීරණය කර තිබූ නමුත් 2022 අප්‍රේල් මස වන විටත් පනත සකස් කර ගැනීමේ කටයුතු ආරම්භක අවස්ථාවේ පැවතුණි. | පටිපාටික රීති සකස් කිරිමට කටයුතු කරනු ලැබේ. තවද අංක 2047/22 හා 2017.11.28 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති පටිපාටික රීති වර්තමාන කොමිෂන් සභාව විසින් අනුගමනය කරනු ලැබේ. | |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2019 හා 2020 වර්ෂවලදී දෙසැම්බර් 31 දිනට විමර්ශන අවසන් කිරීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 72 හා සියයට 70 මට්ටමේ විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විමර්ශන අවසන් කිරීමේ ප්‍රගතිය සියයට 14 තරම් අඩු මට්ටමක පැවතුණි. | 2021 මාර්තු මසදී එතෙක් සිදුකල සමස්ථ විමර්ශන ක්‍රියාවලියම සංශෝධනය කරන ලදී. පළාත් කාර්යාල වලින් විමර්ශන අවසන් කිරීම සඳහා ලැබෙන ගොනු සියල්ල සභාපති විසින් අධ්‍යනය කර අවශ්‍යා වාර්තා හා ලිපි ලේඛන ගෙන්වා ගන්නා බැවින් වැඩි කලයක් ගතවේ. | මහජන පැමිණිලි විභාග කිරීම ප්‍රශස්ත මට්ටමට පත් කර ගත යුතු විම |
| (ආ) මධ්‍යම, ඌව, සබරගමුව උතුර හා නැගෙනහිර පළාත් කාර්යාලයන්හි මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ ප්‍රගතිය 2021 දෙසැම්බර් 31 දිනට සියයට 10 ටත් අඩු මට්ටමක පැවතුණි. | 2021.07.09 හා 2021.10.31 දිනවල කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කල පළාත් අධ්‍යක්ෂවරු වෙනුවට නව අධ්‍යක්ෂවරු 2021.11.01 දින පත්කරන ලද අතර එම කාලය තුල යම් බලපෑමකට ලක්ව තිබුණි. 2022.03.31 දින වන විට ප්‍රගතිය සියයට 8 සිට 15 දක්වා ප්‍රගතියක් පැවතුණි. | පළාත් කාර්යාලවල මහජන පැමිණිලි විභාග කිරීම ප්‍රශස්ත මට්ටමට පත් කර ගත යුතු විම |

## 4. යහපාලනය

-------------

### 4.1 අභ්‍යන්තර විගණනය

----------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතකර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන තනතුර සඳහා නිලධාරියෙක් අනුයුක්ත කරන ලෙස පත්වීම් බලධාරියාගෙන් ඉල්ලුම්කර ඇතත් නිලධාරියෙක් ලබා නොදීම නිසා අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

---------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාත හැර සෙසු පළාත් 08 හි නිලධාරීන් 18 ක් පමණක් සේවය කරන අතර පළාත් අධ්‍යක්ෂවරු (කොන්ත්‍රාත්) 08 දෙනාට අමතරව විමර්ශන නිලධාරීන් 05 ක් සංවර්ධන නිලධාරීන් 04 ක් හා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් එක් අයෙක් විය. පළාත් කාර්යාල වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය සඳහා පළපුරුදු විමර්ශන කණ්ඩායම් එම කාර්යාලවල සේවයේ යොදවා සිටිය යුතු නමුත් එසේ සිදුවී නොතිබුණි. | පළාත් කාර්යාලවල කාර්යමණ්ඩලය වැඩිකිරීම සඳහා එක් සංවර්ධන නිලධාරියෙකු අනුයුක්ත කර ඇති අතර ඔහු කාර්ය සංවර්ධන සහායකයෙකු බැගින් අනුයුක්ත කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත. පළාත් කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් දීර්ඝ කාලීන අත්දැකීම් සහිත නිරන්තර පුහුණුවීම් ලැබූ නිලධාරීන් වන අතර දේශීය හා විදේශීය පුහුණුවීම් ද ලබා දී තිබුණි. | කාර්ය සාධනය ඉහල නැංවීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීම. |